# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2026/39 – 2017 ජූලි 07 වැනි සිකුරාදා – 2017.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, වැඩ බලන ඉඩම් අමාත්‍ය විජේසුන්දර මුදියන්සේලාගේ තිලකරත්න බණ්ඩාර ඒකනායක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නලාගස්දෙනිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක ජීඒ/එච්කේකේ/2016/748 හා 2016.10.27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – තලාවේවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0003
උතුරට: ගා 3883 වැනි මූලික පිඹුරේ කැබලි අංක 56 සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය, ඩබ්ලිව්. ඒ. එන්. ද. සේරම් හිමිකම් කියන තලාවේ වත්ත සහ ගා 3883 වැනි මූලික පිඹුරේ කැබලි අංක 57; දකුණට: ගා 3883 වැනි මූලික පිඹුරේ කැබලි අංක 57 සහ මාර්ගය (මා.සං.අ); බටහිරට: මාර්ගය (මා.සං.අ) සහ ගා 3883 වැනි මූලික පිඹුරේ කැබලි අංක 56.

ටී. බී. ඒකනායක,
ඉඩම් අමාත්‍ය *(වැ.බ.)*.

යොමු අංකය: 4-3/6/2016/එච්ඩබ්ලිව්/188.
2017 මාර්තු මස 24 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 734